න

**නාරම්මල ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-------------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**---------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට නාරම්මල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**--------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**-----------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ ලැබී තිබුණු රු.2,008,064 ක් වූ ආධාර පුනරාවර්ථන ආදායම් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) කරඹේ මී වැව ගිනිපෙන්ද වෙන්දේසි ඉඩමේ රු.50,000 ක් වූ වටිනාකම දෙවරක් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සභාව සතු රු.720,025 ක් වූ ඉඩම් 44 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.2 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**
**---------------------------------**

(අ) ලැබියයුතු ගිණුම්
--------------------
2017 දෙසැම්බර් 31 දිනට රු.32,807,890 ක ලැබියයුතු ගිණුම් ශේෂයෙන් වර්ෂයක් ඉක්මවා නිරවුල් වී නොතිබුණු ශේෂය රු.12,974,366 ක් විය.

(ආ) ගෙවියයුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට රු.26,639,323 ක ගෙවියයුතු ශේෂයෙන් වර්ෂය ඉක්මවා නිරවුල් කර නොතිබුණු ශේෂය රු.6,889,667 ක් විය.

### 1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.179,815,765 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 1.3.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) 2005 අංක 02 දරන තේ, රබර් සහ පොල්වතු (කැබලි කිරීමේ පාලන) පනතේ 23 (අ) වගන්තිය | - | එකතුව අක්කර 43 රූඩ් 02 ක් වූ කරඹේවත්ත සහ රණකෙතපිටිය පොල් ඉඩම් කට්ටි කිරීම සඳහා ඉඩම් කට්ටි කිරීමේ පාලක මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | - | ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් වාර්ෂිකව සමීක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| (i) මු.රෙ 396 | 13,838 | ගෙවීම් සඳහා ඉදිරිපත් නොකරන ලද චෙක්පත් 04 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ii) මු.රෙ 570 | 573,538 | වර්ෂ 02 ක කාලය ඉක්මවා තිබූ තැන්පතු 53 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (iii) මු.රෙ 571 | - | සෑම අර්ධ වර්ෂයක් අවසානයේදී කල් ඉකුත් වූ සියළුම තැන්පතු පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අයිඒඅයි/2002/2 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | - පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**--------------------**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

**--------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.34,890,271 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායමරු.17,849,631 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තුගත ආදායම් | 2017 බිල්කළ ආදායම් | 2017 රැස්කළ ආදායම් | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම් | 2016 බිල්කළ ආදායම් | 2016 රැස්කළ ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 5,956 | 5,010 | 4,617 | 1,739 | 5,941 | 4,472 | 4,472 | 1,415 |
| (ii) | බදු කුලී | 21,792 | 22,307 | 22,448 | 101 | 21,761 | 10,890 | 10,706 | 474 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,151 | 2,355 | 2,355 | - | 2,226 | 6,633 | 6,633 | - |
| (iv) | වෙනත් ආදායම් | 72,815 | 79,641 | 79,577 | 17,423 | 70,554 | 13,804 | 17,341 | 23,392 |
| එකතුව | | 102,714 | 109,313 | 108,997 | 19,263 | 100,482 | 35,799 | 39,152 | 25,281 |

සටහන

----------

සමාලෝචිත වර්ෂය තුළ රැස්කරගෙන තිබුණු රුපියල් මිලියන 108 ක් වූ ආදායම තුළ පසුගිය වර්ෂවල හිඟ ආදායමෙන් ලැබී තිබෙන රුපියල් මිලියන 05 ක් ඇතුළත්ව තිබේ.

**2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ රුපියල් මිලියන 109 ක් වූ බිල්කළ ආදායමෙන් රුපියල් මිලියන 108 ක් අයකරගෙන තිබූ අතර, ඉකුත් වර්ෂවල හිඟ සමඟ සමාලෝචිත වර්ෂය අවසානයේදී රුපියල් මිලියන 19 ක් තවදුරටත් අයකර ගැනීමට තිබුණි.

**2.2.3 වරිපනම් හා බදු**

------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු.1,364,687 ක් වූ වරිපනම් හිඟයෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.999,481 ක් අයකරගෙන තිබූ අතර වර්ෂයේ බිල් කිරීම වූ රු.4,495,019 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ මුදල රු.1,676,840 ක් විය.

(ආ) දඹදෙණිය උප කාර්යාලය විසින් වරිපනම් ඒකක 70 ක අවසන් ගෙවීම් සඳහා 2017 ජූලි රතු නිවේදන නිකුත් කර තිබුණු අතර ඉන් පසුවද ගෙවීම් නොකළ ඒකක වෙනුවෙන් දේපළ තහනම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කුරුණෑගල පාර වම වරිපනම් බදු අංක 35 ට අදාළ බිම් මහලේ 2009 දී රු.108,732 ක් වූ වාර්ෂික තක්සේරුව 2015 වර්ෂයේ තක්සේරුව අනුව රු.100,038 ක් දක්වා අඩුවී තිබුණි.

**2.2.4 කුලී**

-----

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළව වෙළඳ ස්ථාන කුලී වශයෙන් රු.65,753 ක් හා ටෙන්ඩර් මත බදු කුලී වශයෙන් රු.35,518 ක් වර්ෂය අවසානයට අයවීමට පැවතුණි.

(ආ) නාරම්මල පැරණි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 52 ක, නාරම්මල පොදු වෙළඳපොල එළවලු කඩ 22 හා තාවකාලික එළවලු කඩ 05 ක කුලී 2016 අගෝස්තු 25 දිනැති නව තක්සේරුව අනුව අය කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් 2017 වර්ෂයට අදාළව රු.203,900 ක ආදායමක් සභාවට අහිමිවී තිබුණි.

**2.2.5 වෙනත් ආදායම්**

---------------------

සභා සීමාව තුළ වූ දැන්වීම් පුවරු 05 ක් සඳහා රු.108,000 ක් අයකරගෙන නොතිබූ අතර, දැන්වීම් පුවරු 02 ක් වෙනුවෙන් රු.38,000 ක් අඩුවෙන් අයකරගෙන තිබුණි.

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබියයුතුව තිබූ උසාවි දඩ රු.4,912,180 ක් හා මුද්දර ගාස්තු රු.12,511,265 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තියට අනුකූලවශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 520/7 හා 1988 අගෝස්තු 23 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් පනවා තිබුණු අතුරු ව්‍යවස්ථා 42 කට අමතරව පළාත් සභාව විසින් පනවා තිබුණු අතුරු ව්‍යවස්ථා 10 ක් සභාව විසින් වැළඳගෙන තිබුණි.

(ආ) ක්‍රියාත්මක නොකළ කර්තව්‍යන්

අයවැයගත ප්‍රතිපාදන රු.3,930,000 ක සලසා තිබූ ව්‍යාපෘති 51 ක් විවිධ හේතූන් මත සමාලෝචිත වර්ෂය තුළදී ඉටුකර නොතිබුණි.

(ඇ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම.

ඔලියාදෙණිය ජීව වායු ඒකකයේ ඉදිකිරීමේ කටයුතු ගිවිසුම් ප්‍රකාරව සිදු නොකිරීම හේතුවෙන් ආදාහනාගාරයේ කටයුතු සඳහා අපේක්ෂිත ගෑස් ප්‍රමාණයක් එම ඒකකයෙන් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

සමාලෝචිත වර්ෂය තුළ සභාව විසින් කොම්පෝස්ට් කිලෝ ග්‍රෑම් 45650 ක් නිෂ්පාදනය කර එයින් කිලෝ ග්‍රෑම් 43305 ක් විකිණීමෙන් රු.428,050 ක ආදායමක් උපයා තිබුණු අතර, ඒ සඳහා රු.15,931,711 ක මුළු වියදමක් දරා තිබුණි.

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත් වී තිබූ අතර, සභාවට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක හඳුනාගෙන ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණි. මෙම අරමුණු හා ඉලක්ක කරා ළඟාවීම සඳහා සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලින් රු.450,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, එයින් රු.250,670 ක් වැයකර තිබුණි.

## 3.2 මානව සම්පත් කළමනාකරණය

--------------------------------

(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

---------------------------------

සමාලෝචිත වර්ෂයේද තෘතීයික, ද්විතියික හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 07 කට අදාළව පුරප්පාඩු 09 ක් පැවතුණ අතර, ප්‍රාථමික මට්ටමේ තනතුරු 04 කට අදාළව සේවකයින් 07 ක් සහ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවන ප්‍රජාශාලා කම්කරුවන් 03 ක් අතිරික්තව සේවයේ යොදවා තිබුණි.

(ආ) සේවක ණය

---------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2008 දෙසැම්බර් 31 දිනැති හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2008 හි සඳහන් විධි විධානවලට පටහැනිව නිලධාරීන් 04 දෙනෙකුට, එක් අයකුට ලබාදිය හැකි උපරිම ණය මුදල ඉක්මවා ණය ලබාදී තිබුණි.

(ii) සේවය හැරගිය සහ මියගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් රු.11,250 ක ශේෂයක් අයවීමට පැවතුණි.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මීගමුව පාර පිහිටි ගොඩනැගිල්ලක බිම් මහලේ පෞද්ගලික ආයතනයක් 2016 වර්ෂයේ සිට ව්‍යාපාර කටයුතු සිදුකරගෙන යමින් පැවතියද ඉදිවෙමින් පවතින ගොඩනැගිල්ලක් ලෙස සලකා වාර්ෂික වටිනාකම රු.1,000 ක් වශයෙන් දක්වා තිබුණි.

(ආ) 2015 වරිපනම් තක්සේරුව අනුව බිම් මහල සමඟ තට්ටු 04 කින් යුතු ගොඩනැගිල්ලක එක් එක් මහලෙහි වෙන වෙනම ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යන බැවින් වාර්ෂික වටිනාකම් වෙන වෙනම දැක්විය යුතු වුවද, මහල් 04 ම එක් වරිපනම් ඒකකයක් ලෙස තක්සේරු කර වාර්ෂික වටිනාකම රු.277,558 ක් ලෙස දක්වා තිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 නිශ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

අක්‍රියවීම හේතුවෙන් කැබ් රථයක් මාස හයක කාලයක සිට නිශ්ක්‍රීය තත්ත්වයේ පැවතුණි.

## 3.5 හඳුනාගත් පාඩු

ජීව වායු ඒකකයේ ඉදි කිරීමට අදාළව රු.74,790 ක එකතු කළ අගය මත බදු මුදලක් කොන්ත්‍රාත් ආයතනය වෙත වැඩියෙන් ගෙවා තිබුණි.

## 3.6 ප්‍රසම්පාදනය

### 3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය අනුව සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු දැක්වෙන විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සභාව විසින් පිළියෙල කර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකයට සභාවේ සේවයේ නියුක්ත නිලධාරීන් 05 දෙනෙක් අනුයුක්ත කර තිබුණු අතර මෙම නිලධාරීන්ට සභාවේ අනෙකුත් රාජකාරිද පවරාදී තිබීම හේතුවෙන් අභ්‍යන්තර විගණනයේ ස්වාධීනත්වයක් නොමැති බව නිරීක්ෂණය විය.

### 4.2 අයවැය පාලනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ වැඩසටහන් 03 ක් වෙනුවෙන් සලසා තිබූ රු.61,000 ක මුළු අයවැය ප්‍රතිපාදනය ඉතිරි වී තිබූ අතර, වැඩසටහන් 03 ක් වෙනුවෙන් සලසා තිබූ රු.6,228,000 ක මුළු අයවැයගත ප්‍රතිපාදනයෙන් රු.3,977,611 ක් හෙවත් සියයට 64 ක් ඉතිරි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අයවැය ප්‍රතිපාදන සලසා නොතිබූ ප්‍රජා සංවර්ධන වැඩ සටහන් 29 ක් ඉටුකිරීම සඳහා රු.1,151,154 ක් වැය කර තිබුණි.

## 5. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
| --- | --- |
| (අ) ආදායම් පරිපාලනය | (i) හිඟ ආදායම් රැස් කිරීමේ ප්‍රමාදයක් පැවතීම. |
| | (ii) හිඟ ආදායම් වාර්තා පිළියෙල නොකිරීම. |
| (ආ) ලේඛන පවත්වාගෙන යාම | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වා නොගැනීම. |
| (ඇ) වත්කම් පාලනය | (i) වත්කම් පවරා ගැනීමට කටයුතු නොකිරීම. |
| | (ii) වත්කම් අළුත්වැඩියා කටයුතු නොකිරීම. |